16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතු ය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතිරි වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය කසළ හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලැබේ.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර 1 1/2 කට (ඝන අඩි 4 1/2ට) නොඅඩු ධාරිතාවක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසළ බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හැර වෙනත් සෑම අවස්ථාවකදී ම දැවමය, ලෝහමය, ප්ලාස්ටික්, පියනකින් වසා තැබිය යුතු ය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙය නියෝගවල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලි හලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නිත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුලු නොවිය යුතු ය.

22 (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේ දී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) වන ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතු ය.

23. කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක් ම ද, එසේ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළ දී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැනැත්තෙක් ම ද, ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයකුට හෝ වහාම වාර්තා කළ යුතු ය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් තක් කාලයේ භාරව සිටින යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුලුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාරපාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගි වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දැන්සැලේ, නවාතැන්පලේ හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතු ය. එවැනි ස්ථානයක ආසාදන රෝගියකු හෝ ස්පර්ශක රෝගියකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරී විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හා එම කරුණ වහාම වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියකුට වාර්තා කළ යුතු ය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තකු විසින් කඳවුරු පෙදෙස, තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතු ය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ යම් පොලිස් නිලධරයකු විසින්,

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුලු වීම ; සහ

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

30. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්,

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සහ

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්.

අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් කවර හෝ වේලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රඹුක්කන උතුර ග්‍රාම නිලධාරි වසමට අයත්, වික්‍රමශීලා විද්‍යායතන පිරිවෙන පිහිටි භූමි භාගය.

*ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ :-*

| | | |
|---|---|---|
| *උතුරට* | : | ගී කියන්නා වත්ත |
| *දකුණට* | : | පිරිවෙන පාර, |
| *නැගෙනහිරට* | : | ජේ. බී. අතුකෝරල මහතාට අයිති ඉඩම, |
| *බස්නාහිරට* | : | දම්පිටිය වත්ත. |

10-534

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කල්මුණේ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

හසනුල් බාරි ෆාතිමා ෆාජිස් සහ අහමඩ් ලෙබ්බෙ අජිසා නොහොත් අහමඩ් ලෙබ්බෙ අසිජා.

2013 අගෝස්තු මස 29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් එම්. යූ. ටී. සහිනුදීන් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද 2012 ජූලි මස 16 වැනි දින සහතික කළ අංක 12406 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සහනුල් බාරි ෆාතිමා ෆාජිස් සහ අහමඩ් ලෙබ්බෙ අජිසා නොහොත් අහමඩ් ලෙබ්බෙ අසිජා යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි හැත්තෑහයලක්ෂ දසදහස් හාරසිය දාහතයි ශත විසිදෙක (රු. 1,76,10,417.22) ක මුදලක් 2013 ජුනි මස 04 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,76,10,417.22 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 ජුනි මස 05 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 12406 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණෙහි කරෙයිවක්පත්තු කොට්ඨාස 7 හි පිඹුරු අංක 10292 හි පිහිටි කුලතු වලව් පුමි නොහොත් විතාන කුලම් නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. මහරූෆ් විසින් 2010 අගෝස්තු මස 03 වැනි දින සාදන ලද අංක 10524 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම වශයෙන්, උතුරට : එම්. එම්. මුස්තාෆාගේ ඉඩම ද, දකුණට : පී. ටී. සැම්සුදීන්ගේ ඉඩම ද, නැගෙනහිරට : අසීසා හසනුල් බාරිගේ ඉඩම සහ ඉදිරිපස පටුමග සහ බස්නාහිරට : පාරක් සඳහා වෙන් කරන ලද විශාලත්වයෙන් උතුරේ සිට දකුණට බඹ දහතුනහමාරයි 13 1/2 නැගෙනහිර සිට බස්නාහිරට : බඹ දහයයි 10 නොහොත් පර්චස් 0.0. 10.78 ක ඉඩම ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

ඉමම ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එස්. නේසරාජා විසින් මැතකදී කරන ලද මැනීමකින් පසු 2011 සැප්තැම්බර් මස 22 වැනි දින අංක එස්එන්ආර්/2011/441 දරන විස්තරයෙන් පහත සඳහන් පරිදි දක්වා ඇත.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කල්මුණේ මහ නගර සභා සීමාවේ කල්මුණේ අක්කරපත්තු මාර්ගයේ වරිපනම් අංක 1004/9 දරන විතානකුලම් නමැති ඉඩමට මායිම් වශයෙන්, උතුරට : එම්. එම්. මුස්තාෆාගේ ඉඩම ද, දකුණට : පී. ටී. සම්සුදීන්ගේ ඉඩම ද, නැගෙනහිරට : ඒ. හසනුල් බාරිගේ ඉඩම සහ පුද්ගලික අඩිපාර සහ බස්නාහිරට : පාරක් සඳහ වෙන් කරන ලද මෙහි ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග වන ඉඩම විශාලත්වයෙන් පර්චස් 0.0. 10.78ක් හෙවත් හෙක්ටයාර් 0.0273ක් වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති)
මාණ්ඩලික ලේකම්.

10-582/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. -රත්නපුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2013 ජූලි මස 31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මෙහි පහත පළවන උපලේඛනයේ වඩාත් සවිස්තර කර ඇති දේපළ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් 2011 මාර්තු මස 31 වැනි දින සහතික කළ අංක 3125 සහ මෙහි පහත දෙවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති යන්ත්‍ර සූත්‍ර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහ 2012 ජූලි 05 වැනි දින සහතික කළ අංක 4398 දරන උකස් බැඳුම්කරයන් මගින් මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇති හෙයින් ද,

දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම යන අය මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සතු සියලුම කොටස්වල පාහේ හිමිකාරිත්වය දරන බැවිනුත් මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ කොටස්කරුවෙකු වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකරණ කටයුතු වල යෙදී සිටින බැවිනුත් දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම යන අය මැණික් වැලි ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සියලු මෙහෙයුම් කටයුතු කරන බැවිනුත් ඔහු එහි නියම අයිතිකරු වන බැවිනුත් මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් සලසන ලද මූල්‍ය පහසුකම්වල නියම අර්ථලාභියා වනුයේ දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම වන බැවිනුත්,

මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම යන අය හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතු මුදල ගෙවීම පැහැරහැර ඇති හෙයින් ද, 2013 මැයි මස 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත රුපියල් විසිපන් කෝටි හැටඑක්ලක්ෂ නමදාහස් තුන්සිය අනූනමයයි ශත හැත්තෑහයක් (රු. 25,61,09,399.76) අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 25,61,09,399.76 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර වාර්ෂික පොලිය ද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා අංක 3125 සහ 4398 දරන උකස් බැඳුම්කරයන් යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇති දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### පළමුවන උපලේඛනය

(1) සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුළු කෝරළේ මැද පත්තුවේ, කලවාන ප්‍රාදේශීය සභා සීමාවේ දෙල්ගොඩ පිහිටි මැණික්වැලි එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් 2008 ජූනි 8 වැනි දින මැන සාදන ලද අංක 6923 හි ලොට් 8 දැක්වෙන ඉඩමට මායිම්, උතුරට : පිඹුරු අංක 1240 හි ලොට් 6 සහ 7 ලොට් Z සහ ලොට් 5 ද, නැගෙනහිරට : ලොට් 5 සහ 9 ද, දකුණට : පිඹුරු අංක 1240 හි ලොට් 11 සහ ලොට් 4 සහ බස්නාහිරට : පිඹුරු අංක 1240 හි ලොට් 4, 7 සහ ලොට් Z මායිම් වූ එකී අංක 6923 දරන පිඹුර ප්‍රකාරව අනුව අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිස්නමයයි දශම පහයි බිංදුවක (අ. 2 රූ. 3 පර්. 39.50) ක විශාලත්වයක් වන මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 256/259 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුලු කෝරළේ මැද පත්තුවේ කළවාන ප්‍රාදේශීය සභා සීමාවේ දෙල්ගොඩ පිහිටි මැණික්වැලි එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් 2008 ජූනි 8 වැනි දින මැන සාදන ලද අංක 6923 හි ලොට් 9 දැක්වෙන ඉඩමට මායිම්, උතුරට : පිඹුරු අංක 1240 හි ලොට් 8, 5, 4 සහ 14 ද, නැගෙනහිරට : පිඹුරු අංක 1240 ලොට් 14 සහ 11 ද, දකුණට : පිඹුරු අංක 1240 හි ලොට් 11 සහ 4 සහ බස්නාහිරට : පිඹුරු අංක 1240 හි ලොට් 4, සහ ලොට් 11, 8, 5, සහ 4 මායිම් වූ එකී අංක 6923 දරන පිඹුර ප්‍රකාරව අනුව අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දෙකයි දශම හතයි බිංදුවක (අ. 1 රූ. 2 පර්. 2.70) ක විශාලත්වයක් වන මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 256/243 යටතේ ලියාපදිංචි කර ඇත.

මතු සඳහන් අංක 6923 හි පෙන්වා ඇති ලොට් 2, 5, 6 Q යන ඉඩම් කට්ටි මගින් ඇති ප්‍රවේශ අයිතිය සමඟ වේ.

### දෙවැනි උපලේඛනය

සියලු ස්ථාවර යන්ත්‍රෝපකරණ සවිකිරීම ඇතුළුව පහත සඳහන් භාණ්ඩ සියල්ල

*විස්තර* :

| | | |
|---|---|---|
| 1. | 04X80X6' විදරින් ටුවුට් අශ්වබල 7.5 මෝටර් සමග | |
| 2. | 11X83X5' විදරින් ටුවුට් අශ්වබල 7.5 මෝටර් සමග | |
| 3. | 04X50X5' විදරින් ටුවුට් අශ්වබල 7.5 මෝටර් සමග | |
| 4. | අශ්වබල 20 මෝටර් සමග ටී රොලර් | 08 |

*විස්තර*

| | | |
|---|---|---|
| 5. | අශ්වබල 1/2 මෝටර් සමග හියුමිඩිෆයර්ස් | 02 |
| 6. | අශ්වබල 20 මෝටර් සමග "යූලේ" ටී ඩ්‍රයර් | 01 |
| 7. | අශ්වබල 20 (කොන්ක්වෙස්ට්) ටී ඩ්‍රයර් | 01 |
| 8. | අශ්වබල 03 මෝටර් සමග වායුසමීකරණ විදුලිපංකා | 04 |
| 9. | දර පලන උපකරණ | 01 |
| 10. | අශ්වබල 2 1/2 මෝටර් සමග කෙඳි පැදුරු | 02 |
| 11. | අශ්වබල 1/2 මෝටර් සමග 3 T කඳ වෙන්කරන යන්ත්‍ර | 01 |
| 12. | පාට වෙනස්කරන ලද (මොඩල් 8300 W 6000 BTR 1000 W ) යන්ත්‍ර | 03 |
| 13. | අශ්වබල 03 මෝටර් සමග මිඩ්ල්ටන් සිෆ්ටර්ස් යන්ත්‍ර | 04 |
| 14. | අශ්වබල 03 මෝටර් සමග මිඩ්ල්ටන් සිෆ්ටර්ස් යන්ත්‍ර | 08 |
| 15. | අශ්වබල 03 මෝටර් සමග සක්ෂන් පොලන යන්ත්‍ර | 03 |
| 16. | අශ්වබල 03 මෝටර් සමග වෝටා සිෆ්ටර්ස් යන්ත්‍ර | 02 |
| 17. | අශ්වබල 03 ටැරි නිපර් කපන යන්ත්‍ර | 01 |
| 18. | අශ්වබල 3/4 මෝටර් සමග ටී කටර් | 01 |
| 19. | අශ්වබල 03 මෝටර් සමග රෝල් බ්‍රේකර්ස් | 03 |
| 20. | 312 KVA විදුලිය උත්පාදන | 01 |
| 21. | විදුලි බර කිරීමේ යන්ත්‍ර - කිලෝ 150 | 01 |
| 22. | විදුලි බර කිරීමේ යන්ත්‍ර කිලෝ 06 | 01 |
| 23. | සවිකල CTC යන්ත්‍රෝපකරණ | 01 |
| 24. | හීටරය සමග Gem වියලනයන් | 01 |
| 25. | NANTA T 7192 පාට වෙන් කරන යන්ත්‍ර | 01 |
| 26. | මිකී සිෆ්ටර් (අලුත්) | 01 |
| 27. | SHIZUOKA S 600 Q පාට වෙන්කරන යන්ත්‍ර | 01 |
| 28. | පංකා සහ අනෙකුත් උපකරණ සමග (6* 100) භාජන | 09 |
| 29. | පංකා සහ අනෙකුත් උපකරණ සමග (6* 80) භාජන | 03 |
| 30. | ගාමිණී (47") රොලර් | 02 |
| 31. | වෝකර්ස් (47") රොලර් | 02 |
| 32. | වෝකර්ස් (36") රොලර් | 02 |
| 33. | ග්‍රීන් අයිලන්ඩ් (36") රොලර් බේකර් | 03 |
| 34. | ග්‍රීන් අයිලන්ඩ් ඩිරෙක්ෂනල් හියුමිඩිෆර් | 02 |
| 35. | යූලේ - වියලුම් | 01 |
| 36. | හිල්මාක් වියලුම් | 01 |
| 37. | ග්‍රීන් අයිලන්ඩ් 3 T කඳ වෙන්කරන යන්ත්‍ර | 01 |
| 38. | සක්ෂන් පොලන යන්ත්‍ර | 02 |
| 39. | මිඩිටන් සිෆ්ටර් | 02 |
| 40. | මීඩිටන් සයිෆර් (ජම්බර් ෆයිබර් එක්ස්ට්‍රැක්ටර් සමඟ) | 01 |
| 41. | ඩෝස්ට් පංකා | 02 |
| 42. | මිකී සිෆ්ටර් - ග්‍රීන් අයිලන්ඩ් | 04 |
| 43. | ග්‍රීන් අයිලන්ඩ් - වෝටා සිෆ්ටර් | 01 |
| 44. | නැන්ටා පාට වෙන්කරනයන් | 01 |
| 45. | ටී පැකර් | 01 |
| 46. | දර පලන යන්ත්‍ර | 01 |
| 47. | මිකී සිෆ්ටර් (අලුත් ) | 01 |
| 48. | පාට වෙන්කරනයන් (SENVIC – BTR 6000) | 01 |
| 49. | විදුලිය උත්පාදන | 01 |
| 50. | 250 KVA ට්‍රාන්ස්ෆෝමර් | 01 |

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණි (නීති).
මාණ්ඩලික ලේකම්.

10-582/2

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. -රත්නපුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2013 ජූලි මස 31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහ 2013 මැයි මස 16 වැනි දින සහතික කළ අංක 4619 දරන උකස් බැඳුම්කරය මගින් මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ දර්ශණ සුහාෂ් අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ ජයන්ත අබේවික්‍රම සහ දෙවරප්පෙරුමලාගේ දිල්කුෂාන් අබේවික්‍රම උකස්කරුවන් වශයෙන් හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇති හෙයින් ද,

දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ දර්ශණ සුහාෂ් අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ ජයන්ත අබේවික්‍රම සහ දෙවරප්පෙරුමලාගේ දිල්කුෂාන් අබේවික්‍රම යන අය මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සතු සියලුම කොටස්වල පාහේ හිමිකාරිත්වය දරන බැවිනුත් මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ කොටස්කරුවන් වශයෙන් එම සමාගමේ පාලනය හා පරිපාලන කටයුතු වල යෙදී සිටින බැවිනුත් දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ දර්ශණ සුහාෂ් අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ ජයන්ත අබේවික්‍රම සහ දෙවරප්පෙරුමලාගේ දිල්කුෂාන් අබේවික්‍රම යන අය මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සියලු මෙහෙයුම් කටයුතු කරන බැවිනුත් ඔව්හු එහි නියම අයිතිකරුවන් වන බැවිනුත් මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. විසින් සලසන ලද මූල්‍ය පහසුකම් වල නියම ප්‍රතිලාභීන් වනුයේ දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ දර්ශණ සුහාෂ් අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ ජයන්ත අබේවික්‍රම සහ දෙවරප්පෙරුමලාගේ දිල්කුෂාන් අබේවික්‍රම වන බැවිනුත්

මැණික් වැලි ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දෙවරප්පෙරුමලාගේ හෙන්රි අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ දර්ශණ සුහාෂ් අබේවික්‍රම, දෙවරප්පෙරුමලාගේ ජයන්ත අබේවික්‍රම සහ දෙවරප්පෙරුමලාගේ දිල්කුෂාන් අබේවික්‍රම වෙත හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. විසින් සලස්වන ලද මූල්‍ය පහසුකම් ගෙවීම අතපසු කර ඇති හෙයින් ද, 2013 මැයි මස 31 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙත රුපියල් එක්කෝටි හැත්තෑපන්ලක්ෂ පනස්එක්දහස් අටසිය අනූතුනයි ශත අනූනමයක් (රු. 1,75,51,893.99) අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 1,75,51,893.99 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 ජුනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලය ට වැඩිදුර වාර්ෂික පොලිය ද, සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් අංක 4619 දරන උකස් ඔප්පුව යටතේ හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇති දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ ගඟබඩපත්තුවේ දොම්පේ ප්‍රාදේශීය සභාවේ පූගොඩ උප කාර්යාල අංක 2 සීමාවේ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුමාරිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ කුමාරිමුල්ලේ පිහිටි පොලත්තේ ඕවිට ලොට් ඒ ගලගාවවත්ත ලොට් බී සහ සී ගලගාවත්ත හෙවත් ගලගාවවත්ත ලොට් ඩී සහ ගොයැල්ලේවත්ත ලොට් ඊ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ආර්. ගිනිගේ 2013 ජනවාරි මස 20 වැනි දින මැන සාදන ලද අංක 972 හි ලොට් ඒ 2 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට ඃ එම්. එම්. ඒ. හාවිල්ට අයිති ඉඩමේ ලොට් ඒ 1 සහ ඒ 3 ද, නැගෙනහිරට ඃ ලොට් 3 ද, දකුණට ඃ එම්. එස්. ඒ. නිෂාට් සහ එම්. ඒ. එම්. සහිඩ් ගේ ඉඩම සහ බස්නාහිරට ඃ කැරගල් මාවතේ එම්. ඒ. එම්. සහිඩ් හපුආරච්චි සහ බී. එල්. ඩී. අන්සිනෝනා යන අයට අයිති ඉඩම, පිඹුරු අංක 972 අනුව විශාලත්වයෙන් අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් විසිතුනයි දශම හතයි බිංදුවක් (අ. 3 රූ. 3 පර්. 23.70) වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරී (නීති)
මාණ්ඩලික ලේකම්.

10-582/3

---

### හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. - කඩුවෙල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පඬුවාවල කන්කානමලාගේ චානක නලින් පණ්ඩුල.

2013 අගෝස්තු මස 29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද, 2011 දෙසැම්බර් මස 30 වැනි දින අංක 1470 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පඬුවාවල කන්කානමලාගේ චානක නලින් පණ්ඩුල ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්හයලක්ෂ පනස්තුන්දහස් එකසිය හතලිස්තුනයි ශත අසූදෙක (රු. 56,53,143.82) ක මුදලක් 2013 අප්‍රේල් මස 08 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 56,53,143.82ක මුදලට 2013 අප්‍රේල් මස 09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක කටයුතු සඳහා

දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ද ඇතුළුව තදනන්තරව ගෙවන ලද යම්කිසි මුදලක් වේ නම් එකී මුදල අඩු කොට එකී අංක 1470 දරන බැඳුම්කරය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සිරිසුමනතිස්ස මාවතේ, වරිපනම් අංක 177/91 දරන කෝනේගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. තෙපුලන්ගෙඩ 2010 ජූලි 3 වැනි දින මැන සාදන ලද අංක 3600 ඒ දරන පිඹුරෙන් බෙදා වෙන්කළ ලොට් ඒ 1 වශයෙන් හැඳින්වෙන ඉඩම් කොටස වන උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් ඒ 2 ද, දකුණට : එච්. සිරිසේනගේ ඉඩමෙන් ද, සහ බස්නාහිරට : එම්. විල්සන්ගේ ඉඩමෙන් ද, මායිම් වූ එකී අංක 3600 ඒ දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දාහතර (අ. 0, රූ. 1, පර්. 14) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

එකී අංක 1470 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ප්‍රවේශ මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරී (නීති)
මාණ්ඩලික ලේකම්.

10-582/4

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 428916, 249118, 250637.
ගිණුම් අංකය : 1950879101.
සීමාසහිත සරා ඔජ්ස් ලෙදර (පුද්ගලික).

2010 මාර්තු මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2005 ජූලි මස 20 වැනි දින සහතික කරන ලද අංක 265 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බොරලැස්ගමුවේ වේරහැර ගංගාරාම පාරේ කහටගහවත්ත පාරේ අංක 78 දරන ස්ථානයේ සිය ලියාපදංචි කාර්යාලය පවත්වාගෙන යන, සමාගම් පනත යටතේ සංස්ථාපිත කළ සීමාසහිත සරා ඕජ්ස් ලෙදර් (පුද්ගලික) නම් සමාගම ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන එකක් සහ පන් ලක්ෂ තිස් හතර දහස් තුන්සිය හතලිස් හතයි ශත අනූවක (රු. 15,34,347.90) මුදලක් සහ එක්සත් ජනපද ඩොලර් තුන් ලක්ෂ දෙදාස් නවසිය හතලිස් එකයි ශත අසූ හතක (ඇ. ඩොලර් 302,941.97) මුදලක් 2009 සැප්තැම්බර් මස 02 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකක් සහ පන් ලක්ෂ තිස් හතර දහස් තුන්සිය හතලිස් හතයි ශත අනූවක (රු. 15,34,347.90) මුදල සහ එක්සත් ජනපද ඩොලර් තුන් ලක්ෂ දෙදස් නවසිය හතලිස් එකයි ශත අනූ හතක (ඇ. ඩොලර් 302,941.97) මුදල අයකර ගැනීම සඳහා සහ 2009 සැප්තැම්බර් මස 03 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 1,057,000 ක මුදල මත 22% ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ද, ඇමෙරිකානු ඩොලර් 106,186.61 ක මුදල මත 9.26% ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව සහ ඇමෙරිකානු ඩොලර් 177,623.84 මත LIBOR + 4 % ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබා ගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 265 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12 හල්ස්ඩෝප් වීදියේ අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 2005 ජූලි 5 වැනි දින සාදන ලද පිඹුරු අංක 3447/9000 හි දැක්වෙන බස්නාහිර පළාතේ , කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභාවේ බොරලැස්ගමුව උප කාර්යාල සීමාව තුළ වේරහැර කහටගහවත්ත පාරේ වරිපනම් අංක 78 දරන ස්ථානයේ පිහිටි කහටගහවත්ත හෙවත් ගුරුගේවත්ත නම් ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් භූමිය සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් එක්ස් 1 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම් :

උතුරට : ආර්. ලීලාවතීට අයිති ඉඩම ද, නැගෙනහිරට : දොන් බාරොන් සහ අනෙක් අයට අයිති ඉඩම් සහ (අඩි 10ක් පළල පාර) බලයලත් මිනින්දෝරු ටී. ඒ. බූරා විසින් සාදන ලද පිඹුරු අංක 2107 හි දැක්වෙන ලොට් ඒ 1 කොටස ද, දකුණට : පී. ඩී. ගුණතිලක ට අයිති ඉඩම සහ බලයලත් මිනින්දෝරු එල්. ආර්. ජයසුන්දර විසින් සාදන ලද පිඹුරු අංක 9826 හි දැක්වෙන ලොට් ඒ 21 සහ (අඩි 10ක් පළල පාර) බලයලත් මිනින්දෝරු ටී. ඒ. බූරා විසින් සාදන ලද පිඹුරු අංක 2107 හි දැක්වෙන ලොට් ඒ 1 කොටස සහ කහටගහවත්ත පාර ද, බස්නාහිරට : කහටගහවත්ත පාර ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 3447/9000 ට අනුව රූඩ් දෙකයි, පර්චස් විසි දෙකක් විශාල ඉඩම (අ. 0 රූ. 2 පර්. 22)

ඉහත කී ලොට් එක්ස් 1 පහත විස්තර කරන ඉඩම් ඒකාබද්ධ කර නැවත මිණුම් ගත කිරීමකි.

1. බලයලත් මිනින්දෝරු ටී. ඒ. බූරා විසින් 1978 දෙසැම්බර් මස 28 වැනි දින සාදන ලද පිඹුරු අංක 2107 හි දැක්වෙන බස්නාහිර පළාතේ

කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභාවේ දැන් බොරලැස්ගමුව උප කාර්යාල සීමාව තුළ වේරහැර පිහිටි කහටගහවත්ත හෙවත් ගුරුගේවත්ත නම් ඉඩමේ (මෙය බලයලත් මිනින්දෝරු ජේ. ඊ. වෝකර් විසින් 1959 දෙසැම්බර් මස 17 වැනි දින සාදන ලද පිඹුරු අංක 243 හි දැක්වෙන ලොට් ඒ හි නැවත මිනුම් ගත කිරීමකි) ගොඩනැගිලි, ගහකොළ, වගාවන්, භූමිය සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් ඒ 3 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම් :

උතුරට : කටුවාවල පෝරගේ දෝන සෝමරත්න සහ අනෙක් අයට අයිති එම ඉඩමේ ම කොටස සහ කටුවාවල පෝරගේ දෝන ජොහානාහාමිට අයිති එම ඉඩමේ ම කොටස ද, නැගෙනහිරට : පෙර කී පිඹුරු අංක 243 හි ලොට් බී හි පුලුක්කුට්ගේ දොන් බාරොන් ට අයිති ඉඩම් කොටස සහ පෙර කී පිඹුරු අංක 243 හි ලොට් බී හි මොහොට්ටිගේ හැරල්ඩ් ෆීලික්ස් කබ්රාල් ට අයිති ඉඩම් කොටස ද, දකුණට: ලොට් ඒ 4, ඒ 2 සහ ඒ 1 යන ඉඩම් කැබලි ද, බස්නාහිරට : පුලුක්කුට්ගේ දෝන චාර්ලට් ට අයිති එම ඉඩමේ ම කොටස ද, යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 2107 ට අනුව පර්චස් විසි අටයි දශම හයයි දෙකයි පහක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 28.625) දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1115/124 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. බලයලත් මිනින්දෝරු ටී. ඒ. බූරා විසින් 1983 පෙබරවාරි මස 22 වැනි දින සාදන ලද පිඹුරු අංක 2568 හි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභාවේ බොරලැස්ගමුව උප කාර්යාල සීමාව තුළ වේරහැර පිහිටි කහටගහවත්ත හෙවත් ගුරුගේවත්ත නම් ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් භූමිය සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුනු කර ඇති බිම් කොටසට මායිම් :

උතුරට : පට්ටියගේ ඉන්ද්‍රපාල ජීරිස්ට අයිති එම ඉඩමේ ම කොටස ද, නැගෙනහිරට : පෙර කී පිඹුරු අංක 2107 හි ලොට් ඒ 3 නම් පුලුක්කුට්ගේ දෝන ප්‍රේමචන්ද්‍ර සහ අනෙක් අයට අයිති ඉඩම් කොටස ද, දකුණට : පටු පාරද, බස්නාහිරට : පටු පාර ද, යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 2568 ට අනුව රූඩ් එකයි, පර්චස් තිස් පහක් විශාල ඉඩම (අ. 0, රූ. 1, පර්. 35) දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1230/246 වෙළුම/පත් ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, පහත විස්තර කරන මාර්ග වෙන්කරය මතින් ගමන් කිරීමේ අයිතිවාසිකම් ද සහිතවයි.

පෙර විස්තර කරන ලද වේරහැර පිහිටි ගුරුගේවත්ත හෙවත් කහටගහවත්ත නම් ඉඩමේ ගහකොළ, වගාවන් භූමිය, සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද පිඹුරු අංක 2107 හි ලොට් ඒ 1 (අඩි දහයක් පළල) ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම් :

උතුරට : එම ඉඩමේ ම ලොට් ඒ 3 කොටස ද, නැගෙනහිරට : එම ඉඩමේ ම ලොට් ඒ 2 කොටස ද, දකුණට : පටු පාර ද, බස්නාහිරට : පුලුක්කුට්ගේ දෝන චාර්ලට් ට අයිති එම ඉඩමේ ම කොටස ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 2107 ට අනුව පර්චස් හතරයි දශම හතයි පහක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 4.75) දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1115/125 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-601

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම**

2013.08.22 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2010.12.09 දිනැති අංක 2452 දරන උකස් බැඳුම්කරය අනුව 2013.06.30 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් අනූ ලක්ෂ හැත්තෑ අට දහස් එකසිය අනූ අටයි ශත පනස් හතක (රු.9,078,198.57) මුදල සමග රුපියල් හැට අට ලක්ෂ අනූ පන් දහස් හාරසීය තිස් දෙකයි ශත විස්සක (රු.6,895,432.20) මුදල මත වසකරට සියයට දාහතරක් (14%) බැගින් පොළියක් ද, 2013.07.01 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් නාවල, රොඩ්රිගෝ මාවතේ, අංක 12/1 හි ට්‍රාන්ස්වෝටර් ඉන්ජිනියරිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි මහත්වරුන්ගේ අයවිය යුතුව ඇත. (නාවල රොඩ්රිගෝ මාවතේ, අංක 12/1 හි පදිංචි රයිගමගේ විදිත නිරෝෂන පීරිස් මහතා සහ කන්දේගොඩ ගමගේ සාලිකා මධුභාෂිණී මහත්මිය අධ්‍යක්ෂවරු වෙති).

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2010.12.09 දිනැති අංක 2452 දරන එකී උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් අනූ ලක්ෂ හැත්තෑ අට දහස් එකසිය අනූ අටයි ශත පනස් හතක (රු. 9,078,198.57) මුදල සමග 2013.07.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි, වෙන්දේසිකාර ෂොක්මන් හා සමරවික්‍රම මහත්වරුන්ට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැදපත්තුවේ, ජල්තර ග්‍රාමයේ පිහිටි "සුදුවැලිකැටිය" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද 2000 අගෝස්තු 6 දිනැති අංක 6237 දරන පිඹුරෙහි ලොට් B ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් B උතුරට : ගෝමිස් පෙරේරාගේ දේපලෙහි අංක 2001 දරන පිඹුරෙහි ලොට් A ද, නැගෙනහිරට : ගෝමිස් පෙරේරාගේ සහ එම්. ඩී. කරෝලිස් අප්පුහාමිගේ දේපළ ද, දකුණට අංක 2001 දරන පිඹුරෙහි ලොට් C ද, බස්නාහිරට : ගම් සභාව පාර ද මායිම්ව එකී අංක 6237 දරන පිඹුරට අනුව අක්කර දෙකයි පර්චස් තිස් එකක (අ. 2, රූ. 0, පර්. 31) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 419/162 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්. වී. ජේ. අයි. ප්‍රනාන්දු,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
යූනියන් පෙදෙස ශාඛාව.

10-519

## ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 ජුනි 28 වැනි දින දී ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න ලියා සහතික කළ අංක 1801 සහ 2006 අගෝස්තු 01 වැනි දින දරන උකස් බැඳුම්කරය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. වී. විජේකෝන් ලියා සහතික කළ අංක 342 හා 2008 ඔක්තෝබර් 09, 2008 ඔක්තෝබර් 10 සහ 2008 ඔක්තෝබර් 17 වැනි දින දරන සමාගම් උකස් බැඳුම්කරය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. වී. විජේකෝන් ලියා සහතික කළ අංක 381 හා 2009 පෙබරවාරි 10 දින දරන උකස් බැඳුම්කරය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න ලියා සහතික කළ අංක 1800 හා 2006 අගෝස්තු 01 වැනි දින දරන උකස් බැඳුම්කරය ; කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න ලියා සහතික කළ අංක 1802 හා 2006 අගෝස්තු මස 01 වැනි දින දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. වී. විජේකෝන් ලියා සහතික කළ අංක 341 හි 2008 ඔක්තෝබර් 09 දින දරන උකස් බැඳුම්කරය ; කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ ලියා සහතික කළ අංක 319 හා 2011 ජූලි 12 හා 2011 ජූලි 15 දින දරන සමගාමී උකස් බැඳුම්කරය ; කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. හේවාවිතාරණ ලියා සහතික කළ අංක 418 හා 2009 ජුනි 17 හා 2009 ජූලි 18 වැනි දින දරන සමගාමී උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ ලියා සහතික කළ අංක 320 හා 2011 ජූලි 12 සහ 2011 ජූලි 15 දින දරන සමගාමී උකස් බැඳුම්කරය යන සියලු උකස් බැඳුම්කර මත ලැබිය යුතු මුදල් ගෙවීම, සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර තිබෙන හා ලියාපදිංචි අංක PV 10716 දරන (කලින් ලියාපදිංචි අංකය N(PVS) 33259 වූ) සහ ලියාපදිංචි කාර්යාලය මහරගම, පන්සල පාර, අංක 134/1 දරන ස්ථානයේ පිහිටා තිබෙන සමාගමක් වන (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) "සෙල්ටා (ප්‍රයිවෙට්) ලිමිටඩ්" සමාගම් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 අප්‍රේල් 30 වැනි දිනට ඉහත කී අංක 1801, 342, 381, 381, 1800, 1802, 341, 319, 418 සහ 320 දරන උකස් බැඳුම්කර මත, එකී සෙල්ටා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් දෙකෝටි තිස්පන් ලක්ෂ නව දහස් එකසිය විසිනවයකුත් ශත දහනවයක (රු.2,35,09,129.19) මුදලක් හා 2013 මැයි 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අනූතුන් ලක්ෂ හැත්තෑහය දහස් තුන්සිය දෙකකුත් ශත හැත්තෑහයක් (රු. 93,76,302.76) සඳහා වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් පොලිය සහ රුපියල් එක්කෝටි දහතුන් ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස්දෙකක් (රු.1,13,33,332) සඳහා වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් පොලිය ද එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ අසූහතර දහස් පන්සිය හතරකුත් ශත විස්සක (එ. ජ. ඩො. 284,504.20) මුදලක් සහ 2013 මැයි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් එක්සත් ජනපද ඩොලර් විසිඑක් දහස් නවසිය අටකුත් ශත හැට තුනක් එ. ජ. ඩො. 21,908.03) සඳහා වර්ෂයකට සියයට අටක (8%) අවම අනුපාතිකයට යටත්ව LIBOR (ත්‍රෛමාසිකව සමාලෝචිත) +6% අනුපාතිකය මත පොලිය ද, එක්සත් ජනපද ඩොලර් එක්ලක්ෂ හතලිස් දහස් හත්සිය හතලිස් එකකුත් ශත පහක් (එ. ජ. ඩො. 140,741.05) සඳහා වර්ෂයකට සියයට අට (8%) අනුපාතිකය මත පොලිය සහ එක්සත් ජනපද ඩොලර් අනූහත් දහස් හාරසීය හතලිස් එකකුත් ශත තිස් නවයක් (එ. ජ. ඩො. 97,441.39) සඳහා වර්ෂයකට සියයට නවයක (9%) අනුපාතිකය මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දෙකෝටි තිස්පන් ලක්ෂ නවදහස් එකසිය විසිනවයකුත් ශත දහනවයක (රු.2,35,09,129.19) මුදල හා 2013 මැයි 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අනූතුන් ලක්ෂ හැත්තෑහය දහස් තුන්සිය දෙකකුත් ශත හැත්තෑහයක් (රු. 93,76,302.76) සඳහා වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් පොලිය සහ රුපියල් එක්කෝටි දහතුන් ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස්දෙකක් (රු. 1,13,33,332) සඳහා වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් පොලිය ද එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ අසූහතර දහස් පන්සිය හතරකුත් ශත විස්සක (එ. ජ. ඩො. 284,504.20) මුදලක් සහ 2013 මැයි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් එක්සත් ජනපද ඩොලර් විසිඑක් දහස් නවසිය අටකුත් ශත හැට තුනක් (එ. ජ. ඩො. 21,908.63) සඳහා වර්ෂයකට සියයට අටක (8%) අවම අනුපාතිකයට යටත්ව LIBOR (ත්‍රෛමාසිකව සමාලෝචිත) +6% අනුපාතිකය මත පොලිය ද, එක්සත් ජනපද ඩොලර් එක්ලක්ෂ හතලිස් දහස් හත්සිය හතලිස් එකකුත් ශත පහක් (එ. ජ. ඩො. 140,741.05) සඳහා වර්ෂයකට සියයට අට (8%) අනුපාතිකය මත පොලිය සහ එක්සත් ජනපද ඩොලර් අනූහත් දහස් හාරසීය හතලිස් එකකුත් ශත තිස් නවයක් (එ. ජ. ඩො. 97,441.39) සඳහා වර්ෂයකට සියයට නවයක (9%) අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ ව්‍යාපාර බඩුතොග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර ඉහත කී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 418 සහ 320 දරන උකස් බැඳුම්කර මගින් සමාගමේ අධ්‍යක්ෂකරුවන් වන කොළඹ කනත්තගොඩ විතාරණගේ සුනිල් ප්‍රදීප් සහ යහම්පත් අච්චිගේ දෝන චන්ද්‍රිකා ශ්‍රී යන දෙදෙනා විසින් සමාගම සඳහා සහ වෙනුවෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍ර සහ ඉහත සඳහන් අංක 1801, 342, 381, 1800, 1802, 341 සහ 319 යන උකස් බැඳුම්කර මගින් එකී සෙල්ටා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති ඉඩම් සහ පරිශ්‍ර නිදහස්ව දැරීමේ අයිතිවාසිකම (free hold rights) හා ව්‍යාපාර බඩුතොග සහ එහි පිහිටි සියලු දේ. කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1801, 342, 381, 1802, 341 සහ 319 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තරය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, නැගෙනහිර අටුලුගම් කෝරළේ, දැරණියගල ප්‍රාදේශීය සභා ප්‍රදේශ සීමාව ඇතුළත, දැරණියගල පිහිටි "පිටනුගවත්ත' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. එම්. පී. සමරදිවාකර මැන සකස් කළ අංක 451 හා 2000 නොවැම්බර් 25 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම් උතුරට : අංක 275 දරන පිඹුරේ ලොට් අංක 1 හි ඉතිරි කොටස ද, නැගෙනහිරට: අංක 275 දරන පිඹුරේ ලොට් අංක 1 හි ඉතිරි කොටස ද, දකුණට : අංක 275 දරන පිඹුරේ ලොට් අංක 2 හි සහ 9 හි ඉතිරි කොටස් එහෙත් වඩා නිවැරදිව සිමෙන්ති කණුව, අංක 275 පිඹුරේ ලොට් අංක 9 සහ දැරණියගල සිට නූරියට යන ප්‍රධාන පාර ද, බස්නාහිරට : අංක 417 පිඹුරේ ලොට් අංක 1 සහ දැරණියගල නූරිය පාර එහෙත් වඩා නිවැරදිව අංක 417 පිඹුරේ ලොට් අංක 1 හි ඉතිරි කොටස සහ නූරිය සිට දැරණියගලට යන ප්‍රධාන පාර ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 451 පිඹුර ප්‍රකාර රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) නොහොත් හෙක්ටෙයාර බිංදුවයි දශම දෙකයි බිංදුවයි දෙකයි තුනක් (හෙ. 0.2023) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q116/245, 256 යටතේ ලියාපදිංචි කර තිබේ.

**අංක 418 සහ 320 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශ සීමාව තුළ, කොට්ටාව පන්සල පාරේ පිහිටි "සම්බුද්ධි ගොරකගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මැන සකස් කළ අංක 3003 හා 1990 අගෝස්තු 18 දින දරන පිඹුරේ ලොට් B1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කළ බිමද, නැගෙනහිරට : අංක 377 දරන පිඹුරේ ලොට් B දරන බිම් කට්ටියේ කොටසක් වූ දැනට බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන මැන සකස් කළ අංක 2204 හා 1986 පෙබරවාරි 11 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස නිරූපිත ඉඩම ද, දකුණට : ලොට් C එහෙත් වඩා නිවැරදිව බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මැන සකස් කළ අංක 2568 හා 1989 මාර්තු 29 දින දරන පිඹුරේ නිරූපිත (පාරක් සඳහා වෙන්කළ) ලොට් D ද බස්නාහිරට : අංක 2568 පිඹුරේ නිරූපිත ලොට් B2 සහ ලොට් C ද යන මායිම් ඇතුලත ඉහත කී අංක 3003 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස්නවයක් (අ. 0, රූ. 0, පර්. 39) නොහොත් හෙක්ටෙයාර 0.0986 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1776/107 යටතේ ලියාපදිංචි කර තිබේ.

ඉහත සඳහන් ඉඩම නැවත මනින ලදුව පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව ඇතුළත, කොට්ටාව පන්සල පාරේ පිහිටි "සම්බුද්ධි ගොරකගහවත්ත" නමැති ඉඩමේ (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මැන සකස් කළ අංක 3003 හා 1990 අගෝස්තු 18 දින දරන පිඹුරේ ලොට් B 1 දරන බිම් කට්ටිය නැවත මැනීමක් වන) බලයලත් මිනින්දෝරු එස්. ඒ. ඩබ්ලිව් පෙරේරා මැන සකස් කළ අංක 754 හා 2005 මැයි 24 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ඩී. ඒ. රණසිංහ හිමිකම් කියන මෙම ඉඩමේ ම කොටසක් ද, දකුණට : පාර ද, බස්නාහිරට : පාර සහ තිස්ස රාජපක්ෂ හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් (අංක 3003 පිඹුරේ ලොට් B2 හි කොටසක්) යන මායිම් ඇතුළත, ඉහත කී අංක 754 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස් අටකුත් දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 38.20) නොහොත් හෙක්ටෙයාර 0.0966 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

මෙහි පහත විස්තර කරන බිම් කට්ටි තුළින්, මතින් සහ/හෝ ඔස්සේ උකස්කරුවන්ට, ඔවුන්ගේ ආගන්තුකයින්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහ නිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට හා ආරාධිතයන්ට ඔවුන්ගේ මනාපය හා කැමැත්ත පරිදි සියලු කාර්ය සඳහා මින් ඉදිරියට දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ පයින් හෝ අන්‍යාකාරයකින් යාම් ඊම් කිරීමට ද අශ්වයින්, ගව ආදී සතුන් ඇතිව හෝ නොමැතිව ද මෝටර්, කාර්, මෝටර් ලොරි සහ කවර හෝ වර්ගයක වෙනත් වාහනවලින් බර පටවා හෝ නොපටවා, මෙහි මින් ඉදිරියට විස්තර කරන මාර්ග පහසුකම තුළින් හෝ මතින් සදාකල්හිම බාධා විරහිතව ප්‍රවේශ වීමේ, පිටවීමේ, යාම ඊමේ සහ ප්‍රත්‍යාගමනය කිරීමේ පූර්ණ අයිතිවාසිකම, නිදහස හා අවසරය ද එම ඉඩම තුළින්, මතින් සහ/හෝ ඔස්සේ විදුලි රැහැන්, මුදුන් කම්බි හා ජලාපවහන, ගෑස් සහ ජලනල එලීමේ අයිතිවාසිකම භුක්තිවිඳීමේ පූර්ණ හා බාධාවිරහිත හිමිකම ඇතුළත් වේ :-

01. කොට්ටාව, පන්සල පාරේ පිහිටි ඉහත කී "සම්බුද්ධි ගොරකගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක මැන සකස් කළ අංක 2568 හා 1989 මාර්තු 29 දින දරන පිඹුරේ (පවත්නා පාර පළල් කිරීම සඳහා වෙන්කළ බිම් කොටස වූ) ලොට් D ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කොටස වන උතුරට : එකී අංක 2568 දරන පිඹුරේ ලොට් A, B සහ C ද, නැගෙනහිරට : ඉහත කී අංක 377 දරන පිඹුරේ නිරූපිත ලොට් B ලකුණු කළ බිම් කට්ටියෙන් බෙදා වෙන්කළ තවත් බිම් කොටසක් ද, දකුණට : ඉහත කී අංක 1559 දරන පිඹුරේ නිරූපිත (පාර සඳහා වෙන්කළ) ලොට් 3 ද, බස්නාහිරට : ඉහත කී අංක 2568 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 A 2 ද යන මායිම් ඇතුලත එකී අංක 2568 දරන පිඹුර ප්‍රකාර පර්චස් බිංදුවයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 0.6) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1776/108 යටතේ ලියාපදිංචි කර තිබේ '

02. කොට්ටාව, පන්සල පාරේ පිහිටි ඉහත කී "සම්බුද්ධි ගොරකගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන මැන සකස් කළ අංක 1559 හා 1983 නොවැම්බර් 11 දින දරන පිඹුරේ (අඩි 12 ක් පළල පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 3 ලකුණු කළ බිම් කොටස වන උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා මැන සකස් කළ අංක 407 දරන පිඹුරේ නිරූපිත ඉඩමේ කොටසක් සහ මෙම ඉඩමේ ඩී. පී. රණසිංහට අයිති ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු පී. එච්. පෙරේරා මැන සකස් කළ අංක 336 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 3 ද, දකුණට : බලයලත් මිනින්දෝරු වොල්ටර් ඊ. ලූකස් මැන සකස් කළ අංක 377 දරන පිඹුරේ නිරූපිත ලොට් B ද, බස්නාහිරට : පන්සල පාර (Temple Road) ද යන මායිම් ඇතුලත ඉහත කී අංක 1559 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1571/266 යටතේ ලියාපදිංචි කර තිබේ.

### අංක 1800 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මෙහි පහත සඳහන් දේවල් ඇතුලුව එනම් 2006 අගෝස්තු මස 02 වැනි දිනට පැවති ව්‍යාපාරික බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය බඩු බාහිරාදිය සහ දේවල්, අමුද්‍රව්‍ය, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩ, නොනිමි භාණ්ඩ, ඇතුළුව :

| *මුද්‍රණය සඳහා සියලු ෆැබ්‍රික්* | *තොග මීටර්* | *මීටරයක පිරිවැය* | *අගය* |
|---|---|---|---|
| 31" 84 x 28 16/10 1/2 පැනමා ඔප්ටික් වයිට් සහ කැලැන්ඩර් | 0 | | 0 |
| 31" 84 x 28 16/10 1/2 පැනමා සෝප් වොෂ් | 0 | | 0 |
| 31" 85 x 37 20/12 1/2 පැනමා ඔප්ටික් වයිට් සහ කැලැන්ඩර් | 0 | | 0 |
| 62" 84 x 28 16/10 1/2 පැනමා සෝප් වොෂ් | 0 | | 0 |
| 62" 84 x 28 16/10 1/2 පැනමා ඔප්ටික් වයිට් සහ කැලැන්ඩර් | 0 | | 0 |
| 65" 85 x 37 20/12 1/2 පැනමා ඔප්ටික් වයිට් සහ කැලැන්ඩර් | 0 | | 0 |
| 62" 96 x 48 16/12 ඩ්‍රිල් ඔප්ටික් වයිට් ob | 0 | | 0 |
| 62" 96 x 48 16/12 ඩ්‍රිල් සෝප් වොෂ් (වොෂ් ස්කෝර්) | 4791 | 1.35 | 6467.85 |
| 66/67" 96 x 48 61/12 ඩ්‍රිල් ලූම් ස්ටේට්/ග්‍රේප් | 0 | | 0 |
| 66/67" 60 x 60 20/20 ප්ලේන් ෂීටින් ලූම් ස්ටේට්/ග්‍රේප් | 882 | 0.68 | 599.76 |
| 62" 60 x 60 20/20 ප්ලේන් ෂීටින් ඔප්ටික් වයිට් | 0 | | 0 |
| 62" 60 x 60 20/20 ප්ලේන් ෂීටින් සෝප් වොෂ් | 0 | | 0 |
| 48" 60 x 60 20/20 ප්ලේන් ෂීටින් ඔප්ටික් වයිට් | 0 | | 0 |

*මුද්‍රිත ෆැබ්‍රික් :*

| | | | | |
|---|---|---|---|---|
| ගාර්ඩින් රෝස් පින්ක් 62" | 60 x 60 20/20 | 1602 | 1.05 | 1682.1 |
| ගාර්ඩින් රෝස් පින්ක් 71" | 60 x 60 20/20 | 2540 | 1.15 | 2921 |
| ගාර්ඩින් රෝස් ගෝල්ඩ් 61" | 60 x 60 20/20 | 2250 | 1.05 | 2362.5 |
| ගාර්ඩින් රෝස් ගෝල්ඩ් 71" | 60 x 60 20/20 | 2680 | 1.15 | 3082 |
| මැන්හැටන් ග්‍රේ 61" | 60 x 60 20/20 | 330 | 1.05 | 346.5 |
| මැන්හැටන් බ්ලූ 61" | 60 x 60 20/20 | 50 | 1.5 | 75 |
| මැන්හැටන් බ්‍රවුන් 61" | 60 x 60 20/20 | 410 | 1.05 | 430.5 |
| මැන්හැටන් ග්‍රේ 71" | 60 x 60 20/20 | 0 | | 0 |
| මැන්හැටන් බ්ලූ 71" | 60 x 60 20/20 | 232 | 1.15 | 266.8 |
| මැන්හැටන් බ්‍රවුන් 71" | 60 x 60 20/20 | 1751 | 1.15 | 2013.65 |
| මැන්හැටන් බ්ලූ 61" | DRILL | 0 | | 0 |
| මැන්හැටන් ග්‍රේ 56" | DRILL | 1555 | 1.42 | 2208.1 |
| මැන්හැටන් බ්ලූ 56" | DRILL | 800 | 1.42 | 1136 |
| මැන්හැටන් බ්‍රවුන් 56" | DRILL | 800 | 1.42 | 1136 |
| | | | | |
| බෲක්ලින් ග්‍රීන් 49" | 60 x 60 20/20 | 0 | | 0 |
| බෲක්ලින් බ්‍රවුන් 49" | 60 x 60 20/20 | 0 | | 0 |
| බෲක්ලින් ග්‍රේ 49" | 60 x 60 20/20 | 0 | | 0 |
| බෲක්ලින් ග්‍රීන් 61" | 60 x 60 20/20 | 0 | | 0 |
| බෲක්ලින් බ්‍රවුන් 61" | 60 x 60 20/20 | 50 | 1.05 | 52.5 |
| බෲක්ලින් ග්‍රේ 61" | 60 x 60 20/20 | 0 | 0 | 0 |
| බෲක්ලින් ග්‍රීන් 71" | 60 x 60 20/20 | 0 | 0 | 0 |
| බෲක්ලින් බ්‍රවුන් 71" | 60 x 60 20/20 | 736 | 1.15 | 846.4 |
| බෲක්ලින් ග්‍රේ 71" | 60 x 60 20/20 | 370 | 1.15 | 425.5 |
| බෲක්ලින් ග්‍රීන් 56" | DRILL | 645 | 1.42 | 915.9 |
| බෲක්ලින් බ්‍රවුන් 56" | DRILL | 0 | | 0 |
| බෲක්ලින් ග්‍රේ 56" | DRILL | 0 | | 0 |
| | | | | |
| ජුබිලි ක්‍රීම් 61"60 x 60 20/20 | 60 x 60 20/20 | 550 | 1.05 | 577.5 |
| ජුබිලි බර්ගන්ඩි 61" 60 x 60 20/20 | 60 x 60 20/20 | 0 | | 0 |
| | | | | |
| මැඩිසන් ග්‍රේ 71" | 60 x 60 20/20 | 1650 | 1.15 | 1897.5 |
| මැඩිසන් බ්ලූ 71" | 60 x 60 20/20 | 1650 | 1.15 | 1897.5 |
| මැඩිසන් බර්ගන්ඩි 71" | 60 x 60 20/20 | 1950 | 1.15 | 2242.5 |
| මැඩිසන් ග්‍රීන් 71" | 60 x 60 20/20 | 1200 | 1.15 | 1380 |

| *මුද්‍රිත ෆැබ්‍රික්* | | | | *තොග මීටර්* | *මීටරයක පිරිවැය* | *අගය* |
|---|---|---|---|---|---|---|
| ජින්හැම් යෙලෝ 49" | | | 60 x 60 20/20 | 0 | | 0 |
| ජින්හැම් බ්ලූ 49" | | | 60 x 60 20/20 | 0 | | 0 |
| ජින්හැම් ටෙරාකොටා 49" | | | 60 x 60 20/20 | 0 | | 0 |
| ජින්හැම් ග්‍රීන් 49" | | | 60 x 60 20/20 | 0 | | 0 |
| ජින්හැම් යෙලෝ 61" | | | 60 x 60 20/20 | 1432 | 1.04 | 1489.28 |
| ජින්හැම් බ්ලූ 61" | | | 60 x 60 20/20 | 2910 | 1.04 | 3026.4 |
| ජින්හැම් ටෙරාකොටා 61" | | | 60 x 60 20/20 | 2034 | 1.04 | 2115.36 |
| ජින්හැම් ග්‍රීන් 61" | | | 60 x 60 20/20 | 2013 | 1.04 | 2093.52 |
| ඉන්ස්පිරේෂන් 61" | | බේජ් | 60 x 60 20/20 | 4433 | 1.04 | 4610.32 |
| ඉන්ස්පිරේෂන් 61" | | | DRILL | Nill | | |
| හොලි බෙල්ස් 61" | 61" | ක්‍රීම් | 60 x 60 20/20 | 729 | 1.18 | 860.22 |
| | 61" | බර්ගන්ඩි | 60 x 60 20/20 | 2631 | 1.18 | 3104.58 |
| ස්නෝ ෆ්ලේක් | 61" | ක්‍රීම් | 60 x 60 20/20 | 305 | 1.18 | 359.9 |
| | 61" | බර්ගන්ඩි | 60 x 60 20/20 | 64 | 1.18 | 75.52 |
| ෆ්ලවර් බොට්ල් ග්‍රීන් | | 97" | | 1825 | 1.63 | 2974.75 |
| ඔලිව් වෙක් රෝස් | | 97" | | 1363 | 1.63 | 2221.69 |
| ඔලිව් වෙක් ග්‍රීන් | | 97" | | 1235 | 1.63 | 2013.05 |
| ඔලිව් වෙක් බ්ලූ | | 97" | | 1748 | 1.63 | 2849.24 |
| කෝස්ට් වෝල්ඩ් බර්ගන්ඩි | | 97" | | 1769 | 1.63 | 2883.47 |
| ටස්කැනි මල්ටි | | 97" | | 2162 | 1.63 | 3524.06 |
| ඔලිව් වෙක් රෝස් | | | | 2823 | 1.21 | 3415.83 |
| ඔලිව් වෙක් බ්ලූ | | | | 2155 | 1.21 | 2607.55 |
| ඔලිව් වෙක් ග්‍රීන් | | | | 1776 | 1.21 | 2148.96 |
| කොස්ට් වොල්ඩ් බර්ගන්ඩි | | | | 2614 | 1.21 | 3162.94 |
| ෆ්ලවර් බොට්ල් ග්‍රීන් | | | | 2255 | 1.21 | 2728.55 |
| ටස්කැනි මල්ටි | | | | 2482 | 1.21 | 3003.22 |
| ඩයි කළ ෆැබ්රික් : | | | | | | 0 |
| 60/61" ඩයි බයින්ඩින් | බ්ලූ | 60" | | 112 | 0.95 | 106.4 |
| 60 x 60 20/20 ෂීටින් | සේජ් ග්‍රීන් | 60" | | 798 | 0.95 | 758.1 |
| | නේවි බ්ලූ | 60" | | 455 | 0.95 | 432.25 |
| | ටෙරා කොටා | 60" | | 731 | 0.95 | 694.45 |
| | ඔක්ස්ප්‍රෙසෝ | 49" | | 651 | 0.95 | 618.45 |
| | බ්‍රවුන් | 60" | | 730 | 0.95 | 693.5 |
| | බර්ගන්ඩි | 65" | | 0 | 0.95 | 0 |
| | චාකොල් | 60" | | 294 | 0.95 | 279.3 |
| ඩයිඩ් ඩ්‍රිල් | ක්‍රීම් | 60" | | 200 | 1.5 | 300 |
| | ඕෆ් ෂේඩ් ක්‍රීම් | A | | 1348 | 1.5 | 2022 |
| | | B | | 1698 | 1.5 | 450 |
| මුද්‍රණය නොකළ | බර්ගන්ඩි | 60" | | 300 | 1.5 | 450 |
| | ඕෆ් ෂේඩ් බර්ගන්ඩි | A | | 597 | 1.5 | 895.5 |
| | යෙලෝ | 60" | | 350 | 1.5 | 525 |
| | බ්ලූ | 60" | | 622 | 1.5 | 933 |
| | ටෙරා කොටා | 60" | | 398 | 1.5 | 597 |
| | රෙඩ් | 60" | | 325 | 1.5 | 487.5 |
| | බොට්ල් ග්‍රීන් | 60" | | 183 | 1.5 | 274.5 |

මුළු අගය එ.ජ.ඩො. 98845.45

සහ

ශ්‍රී ලංකා ජනරජයේ, සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල, හම්බන්වෙල, නූරි පාරේ පරිශ්‍රය තුළ සහ මත ගබඩාකර තිබෙන වෙනත් සියලු අයිතම හා සෑම ආකාරයකම සහ සෑම විස්තරයකටම අයත් කවර වූ හෝ වෙනත් චංචල දේපල ද සමාගම විසින් දැනට ව්‍යාපාරය කරගෙන යන හෝ මින් මතු යම් කලක හා කලින් කළ සමාගම විසින් ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි වෙනත් සියලු ගුදම්, ගබඩා සහ පරිශ්‍ර තුළ හෝ

මත තිබෙන සෑම ආකාරයකම සහ සෑම ස්වභාවයකම වෙනත් සියළු අයිතම හා වෙනත් චංචල දේපල හෝ එම ව්‍යාපාර බඩුතොග, වෙළඳ භාණ්ඩ, බඩු බාහිරාදිය සහ දේවල්, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි හා නොනිමි භාණ්ඩ, හා කවර හෝ වර්ගයකට හෝ ස්වභාවයක චංචල දේපල ද, මින් ඉදිරියට යම් කාලයක සහ කලින් කල හා සෑම කල්හිම එම ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය බඩු බාහිරාදිය සහ අමුද්‍රව්‍ය, නිමි හා නොනිමි භාණ්ඩ යනාදිය ගබඩා කර, තබා හෝ දමා තිබිය හැකි යම් ගුදම්, ගබඩා හා පරිශ්‍රවල ඇති සමාගමේ සියලු අයිතම හා චංචල දේපලද, මෙම බැඳුම්කරය බලාත්මකව පවතින කාලය ඇතුලත යම් වේලාවක සහ කලින් කල හා සෑම කල්හිම සමාගම විසින් එකී ගුදම්, ගබඩා හා පරිශ්‍ර තුලට හෝ මතට ගෙනැවිත් තබනු, ගබඩා කරනු හෝ දමනු ලැබිය හැකි සියලු ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රවය, බඩු බාහිරාදිය හා දේවල්, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි හා නොනිමි භාණ්ඩ සහ වෙනත් සියලු අයිතම හා චංචල දේපල ද, සමාගම විසින් ඒ ව්‍යාපාරය හෝ කර්මාන්තය මින් මතු කලින් කල ඉවත් කරගෙන යනු ලබන හෝ එකී ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය බඩු බාහිරාදිය සහ දේවල් හා අමුද්‍රව්‍ය, නිමි හා නොනිමි භාණ්ඩ, සහ වෙනත් සියලු අයිතම හා කවර හෝ වර්ගයක හෝ ස්වභාවයක වූ හා ඉහත කී ගුදම්, ගබඩා සහ පරිශ්‍ර හෝ ව්‍යාපාර ස්ථානවලින් හෝ ව්‍යාපාර ස්ථාන තුලට ගෙනයමින් පවතින සියලු සංක්‍රාන්තික දේපල හෝ නැව්ගත කිරීම හෝ නිශ්කාෂනය අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා ජනරජයේ, කෑගලු දිස්ත්‍රික්කයේ වාප්පුවේ හෝ ගුදම්වල තිබෙන සමාගමේ වෙනත් සියලු චංචල දේපල ඇතුළුව සමාගමේ වෙනත් සියලු අයිතම හා කවර හෝ වර්ගයක හෝ ස්වභාවයක චංචල දේපල.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරි.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10-605

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.